# ඉතිහාසය

# 10 ශ්‍රේණිය

## කාර්ය පත්‍රිකා සංග්‍රහය



කලාප අධ්‍යාපන කාර්යාලය

අම්පාර

# ඒකකය - ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍ර

එච්.පී.හර්ෂණ ඉන්ද්‍රජිත් මයා (0718247522) - ශ්‍රී ලං.ගු.සේ. - අම්/හිමිදුරාව විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 01

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ඉතිහාසය හැදෑරීමේ දී අප විසින් පොදුවේ භාවිතා කරනු ලබන සියලුම දෑ,
   I. මූලාශ්‍ර වේ. III. අභිලේඛන වේ.
   II. ග්‍රන්ථ වේ. IV. සෙල්ලිපි වේ.

02. ඉතිහාසය අධ්‍යනයේ දී තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් කොටස් 02 කට වර්ග කෙරේ. ඒවා නම්,
   I. කාසි හා නටඹුන් III. පුරා විද්‍යාත්මක හා සාහිත්‍ය
   II. ග්‍රන්ථ හා ලේඛන IV. සෙල්ලිපි හා තඹපත්

03. ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර වඩාත් පැරණිතම සාහිත්‍ය මූලාශ්‍රය වන්නේ
   I. ථූපවංශය II. දීපවංශය III. දාඨා වංශය IV. මහාවංශය

04. දික්සඳ සෙනවියා පිරිවෙන් විහාර වාසි මහා නාම හිමි විසින් රචනා කරන ලද සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස හැඳින්විය හැක්කේ,
   I. මයුර සංදේශය III. මහාවංශය
   II. රාජාවලිය IV. බුත්සරණ

05. ශ්‍රී ලංකාවට නොපැමිණිය ද ලංකාව පිළිබඳ අසා දැන ගත් තොරතුරු මත ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් කරමින් ග්‍රන්ථයක් රචනා කරන ලද පෘතුගීසි පූජකවරයා,
   I. මෙගස්තිනිස් III. රිබෙයිරෝ
   II. ටොලමි IV. ෆර්නාඕ ඩී ක්වෙරෝස්

06. ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු අධ්‍යනයේදී ක්‍රි:ව:12 වන සියවසට අයත් පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙසින් හැඳින්විය හැක්කේ,
   I. පොළොන්නරුව ගල්පොත සෙල්ලිපිය III. වල්ලිපුරම් රන්පත
   II. පනාකඩුව තඹ සන්නස IV. අශ්ව හිස සහ මිනිසා

07. ක්‍රි:ව: පස්වන සියවසට අයත් ශ්‍රී ලංකාවේ විසූ කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් , ආභරණ හා රූපලාවන්‍ය කටයුතු පිළිබඳව පැහැදිලිව තොරතුරු අනාවරණය කර ගත හැකි අවස්ථාවක් වන්නේ,
   I. නිශ්ශංක ලතා මණ්ඩපය III. අජන්තා සිතුවම්
   II. සීගිරි බිතු සිතුවම් IV. සාලිය අශෝක මාලා

08. පොළොන්නරු යුගයට අයත් ගල්පොත සෙල්ලිපිය කරවන ලද රජතුමා වන්නේ,
   I. නිශ්ශංකමල්ල රජතුමා III. මහා පරාක්‍රමබාහු රජතුමා
   II. පළමුවන විජයබාහු රජතුමා IV. සහාසමල්ල රජතුමා

09. ශ්‍රී ලංකාවෙන් හමුවන පැරණිතම කාසිය හඳුන්වනු ලබන්නේ,
   I. ධරණ කාසි III. ලක්ෂ්මී කාසි
   II. කහාපණ කාසි IV. තඹ මස්ස

10. මෙරට වැඩ වාසය කරා වූ භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම වැනි දෑ වාර්තා කිරීම සඳහා ලියන ලද සෙල්ලිපි විශේෂය වූයේ,
   I. ගිරි ලිපි III. ටැම් ලිපි
   II. ලෙන් ලිපි IV. පුවරු ලිපි

## II කොටස

**11.**

I. පහත සඳහන් මූලාශ්‍ර අතරින් සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් හා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර දෙකක් තෝරා ලියන්න.
**(කොන්ස්තන්තීනු හටන, පරාක්‍රම සමුද්‍රය, පැරකුම්බා සිරිත, ගල්පොත සෙල්ලිපිය, වී.ඕ.සී. කාසි)**

II. පහත සඳහන් සාහිත්‍ය මූලාශ්‍ර වල කතුවරුන් සඳහන් කරන්න.

1. නැවුරලිස්හිස්ටෝරියා - ......................................................................
2. ඉන්ඩිකා - ......................................................................
3. එදා හෙළදිව - ......................................................................
4. ඩිමුන්ඩො - ......................................................................

III. පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

IV. ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යනයේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙසට සීගිරි චිත්‍ර වල වැදගත්කම කරුණු දෙකකින් විස්තර කරන්න.

**12.**

I. ඉතිහාසය පිළිබඳ කරුණු අධ්‍යනයේ දී සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03ක් සඳහන් කරන්න.

II. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ලෙසින් වඩා වැදගත් වන ශිලා ලිපි හෙවත් සෙල්ලිපි ඒවා ලියා ඇති ගල්වල ස්වරූපය අනුව වර්ගකර දැක්විය හැකි ආකාර 04ක් සඳහන් කරන්න.

III. සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනයේ ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

IV. ඉතිහාසය පිළිබඳව කරුණු අධ්‍යනයේ දී සාහිත්‍ය මූලාශ්‍ර වලට වඩා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වඩා වැදගත්වන ආකාරය උදාහරණ සහිතව කරුණු දෙකකින් පැහැදිලි කරන්න.

13.

I. පහත සඳහන් මූලාශ්‍ර අතරින් ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර 03ක් සඳහන් කරන්න.
**(ඉංග්‍රීසි හටන, එදාහෙළදිව, මහා වංශය, භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, බෞද්ධ රාජධානි පිළිබඳ විස්තර)**

II. පහත සඳහන් අභිලේඛන ලියා ඇති මාධ්‍ය අනුව උදාහරණය බැගින් සපයන්න.

**1. දැව 2.රන්තහඩු 3.ශිලා 4.තඹ තහඩු**

III. පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙසින් ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන නටඹුන් දෙස විමසිලිමත්ව නිරීක්ෂණය කිරීමේ දී මෙරට විසූ අතීත ප්‍රජාව සතු වූ විවිධ දක්ෂතා පිළිබඳව නිරවුල් දැනුමක් ලබාගත හැකි ආකාරය විස්තර කරන්න.

IV. වර්තමානය වන විට ශ්‍රී ලංකාව සතු පුරා විද්‍යාත්මක මූලාශ්‍ර මිනිස් ක්‍රියාකාරකම් වල බලපෑම මත විනාශයට ලක් වන ආකාරය කෙසේ දැයි කරුණු දෙකකින් විස්තර කරන්න.

14.

I. පහත සඳහන් හැඳින්වීමට අදාළ සෙල්ලිපි වර්ගය සඳහන් කරන්න.

01. සකස් කර ගත් ගල් පුවරු මත ලියූ ලිපි
02. ගල්ලෙන් වල කටාරම අසල ලියූ ලිපි
03. සකස් කර ගත් කුළුණු මත ලියූ ලිපි

II. ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද විදේශීය කාසි වර්ග තුනක් ලියන්න.

III. ඉතිහාසය පිළිබඳ තොරතුරු අධ්‍යයනයේ දී කාසි ඉතා වැදගත් මූලාශ්‍රයකි. ශ්‍රී ලංකාව තුළ පැරණි කාසි භාවිතය තුළින් අනාවරණය කර ගත හැකි වැදගත් කරුණු තුනක් සඳහන් කරන්න.

IV. ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසෙන් පසු ශ්‍රී ලංකාව තුළ පිහිටවනු ලැබූ ශිලා ලේඛන තුළ වාර්තා කර තැබූ කරුණු හතරක් ලියන්න.

****

# ඒකකය - ශ්‍රී ලංකාවේ ජනාවාස

ඒ.එම්.එන්.ආර්.බණ්ඩාර මයා (0703530851) - ශ්‍රී ලං.ගු.සේ. - අම්/උහන ජාතික පාසල

## කාර්ය පත්‍රිකා අංක 02

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි ගණන වන්නේ,
    - I. 1කි.
    - II. 2කි.
    - III. 4කි.
    - IV. 1කි.

02. ශ්‍රී ලංකාව ජනාවාස කර ලද මානවයා වන්නේ,
    - I. හෝමෝ ඉරෙක්ටස්
    - II. හෝමෝ හැබිලිස්
    - III. හෝමෝ සාපියන්
    - IV. නියැන්ඩතාලන් සිස්

03. ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ස්ථානයක් නොවන්නේ,
    - I. රත්නපුරේ මැණික් පතල් ආශ්‍රිතව
    - II. හම්බන්තොට පතිරාජවෙල
    - III. උඩරංචා මඩම
    - IV. පාහියන්ගල ලෙන

04. ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස සැලකෙන්නේ,
    - I. ක්‍රි.පූ. 125000 සිට ක්‍රි.පූ. 1800 දක්වා
    - II. ක්‍රි.පූ. 1500 සිට ක්‍රි.පූ. 750 දක්වා
    - III. ක්‍රි.ව. 750 සිට ක්‍රි.ව. 450 දක්වා
    - IV. ක්‍රි.ව. 450 සිට ක්‍රි.ව. 300 දක්වා

05. වසර 38000 ක් ඉපැරණි ගල් ගුහාව කුමක්ද?
    - I. කුරුවිට බටදොඹලෙන
    - II. අත්තනගොඩ අළුලෙන
    - III. පාහියංගල ලෙන
    - IV. කිතුල්ගල බෙලිලෙන

06. තෙත් කලාපීය එළිමහන් වාසස්ථානයක් වන්නේ,
    - I. මිනිහා ගල් කන්ද
    - II. බූන්දල
    - III. බෙල්ලන්බැඳි පැලැස්ස
    - IV. පතිරාජවෙල

07. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවන රටාවට අනුව කණ්ඩායමකට අයත් සාමාජික සංඛ්‍යාව කොපමණද?
    - I. 15-25 අතර
    - II. 20-30 අතර
    - III. 5-6 අතර
    - IV. 30-45 අතර

08. ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර සොයා දිනකට ගමන් කළ දුර වන්නේ,
    - I. 7km
    - II. 8km
    - III. 3km
    - IV. 10km

09. වසර 12500 කට ඉහත කාලයකදී පුළුස්සා ආහාරයට ගත් කැලෑදෙල් ඇට හමු වූ ගල් ගුහාව කුමක්ද?
    - I. කුරුවිට බටදොඹ ලෙන
    - II. පාහියංගල ලෙන
    - III. කිතුල්ගලබෙලි ලෙන
    - IV. අත්තනගොඩ අළුලෙන

10. ලුණු මිශ්‍ර කලපු බෙල්ලන් ආහාරයට ගත් බවට සාක්ෂි ලෙස කලපු බෙල්ලන්ගේ අවශේෂ හමුවන ගල්ගුහාව වන්නේ ,
    - I. කිතුල්ගල බෙලි ලෙන
    - II. පාහියන්ගල ලෙන
    - III. බටදොඹ ලෙන
    - IV. අත්තනගොඩ අළුලෙන

## II කොටස

01.




I. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්ද?
II. මෙය පිහිටා ඇති ස්ථානය කුමක්ද?
III. මෙය පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේ ද?
IV. මෙය භාවිත කර තිබෙන්නේ කුමන කාර්යයක් සඳහාද?

02.



I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
II. මෙය පිහිටා තිබෙන්නේ කොහේද?
III. මෙය පිහිටා තිබෙන දිස්ත්‍රික්කය කුමක්ද?
IV. මෙය භාවිත කොට ඇති කාලය කුමක්ද?

03.




I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
II. මෙය සකස් කිරීම සඳහා භාවිත කරන ලද අමුද්‍රව්‍ය කුමක්ද?
III. මෙය භාවිත කරන ලද යුගය කුමක්ද?

04.
I. ප්‍රාග් ඓතිහාසික යුගය යනු කුමක්ද?
II. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි දෙක නම් කරන්න.
III. ප්‍රාග් මානවයා වාසය කළ පරිසර කලාප 05ක් නම් කරන්න.
IV. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජනාවාසවල ස්වරූපය උදාහරණ 03ක් දක්වා ඒවා කෙටියෙන් විස්තර කරන්න.

05.
I. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වීමට වැඩි රුචිකත්වයක් දැක්වූ ප්‍රදේශ 03ක් නම් කරන්න.
II. ගල් යුගයේ මිනිසා වාසය කළ තෙත් කලාපීය හා වියළි කලාපීය ලෙන් දෙක බැගින් ලියන්න.
III. ප්‍රාග් මානවයා වාසය කළ එළිමහන් වාසස්ථාන වලට උදාහරණ 03ක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න.
IV. ප්‍රාග් මානවයාගේ ජීවන රටාවේ ලක්ෂණ 03ක් දක්වා ඉන් දෙකක් පැහැදිලි කරන්න.

06.
I. වියළි කලාපීය ජනයා ආහාරයට ගත් සත්වයින් තිදෙනෙක් නම් කරන්න.
II. ගල් යුගයේ මානවයා භාවිතයට ගත් පිෂ්ටය සහිත ආහාර 04ක් සඳහන් කරන්න.
III. ගල් යුගයේ තාක්ෂණය උදාහරණ 02ක් සහිතව විස්තර කරන්න.
IV. ප්‍රාග් ඓතිහාසික යුගයේ ජනයාගේ අභිචාර විධි ගැන උදාහරණ 03ක් දක්වා ඉන් දෙකක් කෙටියෙන් පහදන්න.

****

# ඒකකය - ශ්‍රී ලංකාවේ ජනාවාස

ඒ.එම්.එන්.ආර්.බණ්ඩාර මයා (0703530851) - ශ්‍රී ලං.ගු.සේ. - අම්/උහන ජාතික පාසල

## කාර්ය පත්‍රිකා අංක 03

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ප්‍රාග් ඓතිහාසික යුගයේ සාමාන්‍යයෙන් වැඩුණු පිරිමියෙකුගේ උස කීයද?
   - I. 40 cm
   - II. 174 cm
   - III. 166 cm
   - IV. 92 cm

02. දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද මිනිස් හිස් කබලක් හමු වූ ගල් ගුහාව වන්නේ,
   - I. රාවණා ඇල්ල ගල්ගුහාව
   - II. බටදොඹලෙන
   - III. පාහියන්ගල ලෙන
   - IV. අලිගල ලෙන

03. උඩරංචා මඩම නිවාසය කැණීම් කොට සොයා ගත් වර්ෂය වන්නේ,
   - I. ක්‍රි.ව. 2009
   - II. ක්‍රි.පූ. 1129
   - III. ක්‍රි.ව. 2007
   - IV. ක්‍රි.ව. 1990

04. මුල් ඓතිහාසික යුගය ලෙස සැලකෙන්නේ,
   - I. ක්‍රි.පූ. 800 සිට ක්‍රි.පූ. 400 දක්වා
   - II. ක්‍රි.පූ. 450 සිට ක්‍රි.ව. 300 දක්වා
   - III. ක්‍රි.පූ. 300 සිට ක්‍රි.ව. 200 දක්වා
   - IV. ක්‍රි.ව. 210 සිට ක්‍රි.ව. 350 දක්වා

05. වාර්ෂික වර්ෂාපතනයේ අගය මිලිමීටර් 1000 – 1250ක් ලැබෙන ප්‍රදේශය හඳුන්වන කලාපය වන්නේ,
   - I. තෙත් කලාපය
   - II. ශුෂ්ක කලාපය
   - III. අර්ධ ශුෂ්ක
   - IV. වියළි කලාපය

06. තිස්සමහාරාම වැව ඉදි කළ රජු වන්නේ,
   - I. වසභ රජතුමා
   - II. මහසෙන් රජතුමා
   - III. ඉලනාග රජතුමා
   - IV. පණ්ඩුකාභය රජතුමා

07. මුල් ඓතිහාසික යුගයේ පැවති “කේවට්ට ග්‍රාම” යනු,
   - I. ගොවියන් විසූ ගමකි.
   - II. ගොපල්ලන් විසූ ගමකි.
   - III. ධීවරයින් විසූ ගමකි.
   - IV. කුඹල් කරුවන් විසූ ගමකි.

08. අතීතයේ බ්‍රාහ්මී සෙල්ලිපියක පුර කමත යනුවෙන් හඳුන්වා ඇත්තේ,
   - I. නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියාය.
   - II. මුදල් අච්චු ගැසීමේ නිලධාරියාය.
   - III. සිරිත් විරිත් පිළිබඳ අධ්‍යක්ෂවරයාය.
   - IV. ප්‍රධාන ලිපිකරුවාය.

09. අතීතයේ සාමාන්‍ය ගමක ජීවත් වූ පවුල් ගණන වන්නේ?
   - I. 5 – 6 අතර
   - II. 10 – 15 අතර
   - III. 8 – 10 අතර
   - IV. 12 – 19 අතර

10. දසගම් ඇත්තන් පිළිබඳ සඳහන් සෙල්ලිපිය වන්නේ,
   - I. මාතලේ ඇඹුල් අඹේ සෙල්ලිපිය
   - II. කෑගල්ල යටහා ලෙන සෙල්ලිපිය
   - III. මාතලේ කළු දිය පොකුණ සෙල්ලිපිය
   - IV. සොරබොර වැව ටැම් ලිපිය

## II කොටස

01.



I. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්ද?

II. මෙය පිහිටා ඇති ස්ථානය කුමක්ද?

III. මෙය කුමක් සඳහා භාවිත කර තිබෙන්නේද?

IV. මේවා තුළ ආරක්ෂා කර තබා ඇත්තේ මොනවාද?

02.



I. මෙම රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක්ද?

II. එය සොයා ගත් ස්ථානය කුමක්ද?

III. මෙය සැකසීම සඳහා භාවිත කර ඇති සරල යන්ත්‍රය කුමක්ද?

IV. මෙම නිර්මාණය මඟින් කුමන යුගයක තාක්ෂණය හෙළි වේද?

03.



I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

II. මෙය සකසා ඇති වර්ෂය කුමක්ද?

III. මෙය කැණීම් කොට සොයාගෙන ඇති වර්ෂය කුමක්ද?

IV. මෙය භාවිත කරන ලද යුගය කුමක්ද?

04.

I. පූර්ව ඓතිහාසික යුගය යනු කුමක්ද?

II. පූර්ව ඓතිහාසික යුගය හැඳින්වෙන වෙනත් නම් දෙකක් ලියා දක්වන්න.

III. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පූර්ව ඓතිහාසික යුගය වෙන්වන සාධක තුනක් දක්වා ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

IV. පූර්ව ඓතිහාසික යුගයේ භාවිතා කරන ලද සුසාන වර්ග 03ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න.

05.

I. මහා ශිලා සුසාන පැවති ස්ථාන 03ක් නම් කරන්න

II. පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කෙටියෙන් පහදන්න.

III. පූර්ව ඓතිහාසික යුගයේ ජීවන රටාවේ ලක්ෂණ දෙකක් ගෙන පැහැදිලි කරන්න.

IV. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිඹිබු වන සාධක 03ක් දක්වා ඒවා කෙටියෙන් හඳුන්වන්න.

06.

I. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක 03ක් සඳහන් කරන්න.

II. මහා වංශයේ සඳහන් පරිදි මුල් ඓතිහාසික යුගයේ පැවති වාපි ගම් 04ක් නම් කරන්න.

III. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහ 03 නම් කර ඉන් දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න.

IV. මුල් ඓතිහාසික යුගයේ යැපීම් ක්‍රමය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

****

# ඒකකය - ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශනය වීම.

ඒ.පී.ආර්.අයේෂා ලක්මාලි (0712670476) - ශ්‍රී ලං.ගු.සේ. - අම්/අඹගහවැල්ල මහා විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 04

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සෙල්ලිපි ලිවීම ආරම්භ වූ කාලයේදී ප්‍රභූවරුන් හැඳින්වීමට සෙල්ලිපිවල භාවිතා කරන ලද නම වන්නේ ,
   I. ගමණි නමිනි.
   II. පරුමක නමිනි.
   III. ප්‍රධානියා නමිනි.
   IV. ගහපති නමිනි.

02. පරුමකවරුන්ට රජයේ ඉහළ තනතුරු ලබා දී දේශපාලන බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද රජු වන්නේ,
   I. පණ්ඩුකාභය රජු
   II. දේවානම්පියතිස්ස රජු
   III. දුටුගැමුණු රජු
   IV. වසභ රජු

03. සංවිධානාත්මක මධ්‍ය පාලනයක් සඳහා අංග සම්පූර්ණ නගරය ඉදි කරන ලද්දේ,
   I. විජය යි.
   II. අනුරාධ යි.
   III. උපතිස්ස යි.
   IV. පණ්ඩුකාභය රජු යි.

A - රුවන්වැලි මහා සෑය ඉදි කිරීම.
B - ලම්භකරණ රාජ වංශයේ ආරම්භක පාලකයා වීම.
C - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
D - ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරය ඇරඹීම.
E - පළමු වරට විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීම.

04. ඉහත සිදුවීම් වලින් දුටුගැමුණු රාජ්‍ය සමයට අයත් සිදුවීම් දැක්වෙන පිළිතුර වන්නේ,
   I. A හා C
   II. A හා D
   III. B හා C
   IV. B හා E

05. ඉහත සිදුවීම් අතරින් වසභ රාජ්‍ය සමයට අයත් සිදුවීම් දැක්වෙන පිළිතුර වන්නේ :
   I. A හා B
   II. A හා D
   III. B හා C
   IV. B හා E

06. රාජ්‍යත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රතිඵලය වූයේ ,
   I. බලය විමධ්‍යගත වීම.
   II. රාජධානි අතර ගැටුම් ඇති වීමයි.
   III. ප්‍රාදේශීය පාලකයන් බලවත් වීමයි.
   IV. බලය මධ්‍යගත වීම.

07. ශ්‍රී ලංකාවේ ඇතැම් පාලකයන් අසල්වැසි රටවල් සමඟින් විවාහ සබඳතා ඇති කර ගැනීමෙන් අනාවරණය නොවන්නේ,
   I. අසල්වැසි රටවල පාලකයන් හා ලාංකික පාලකයන් අතර සුහදතාව පැවති බවයි.
   II. ලාංකික රජවරුන්ගේ බල පරාක්‍රමය විදේශ රටවලට ද ව්‍යාප්තව පැවති බවයි.
   III. ඥාති සබඳතා තුළින් දේශපාලන බලය ස්ථාවර කර ගත් බවයි.
   IV. විදේශ කුමාරිකාවන් සරණ පාවා ගැනීම මෙරට රජවරුන්ගේ චාරිත්‍රයක්ව පැවති බවයි.

08. අතීතයේදී පෙරදිග රටවල බහුතරය කැමැත්තෙන් තෝරා පත් කර ගත් පාලකයා හැඳින්වෙන ලද නම වන්නේ,
   I. මපුරුමුකා
   II. ග්‍රාමික
   III. මහා සම්මත
   IV. චක්‍රවර්තී

09. වසර 44ක් සාධාරණ හා නීතිගරුක පාලනයක් ගෙන ගිය යැයි සැළකෙන අනුරාධපුර ද්‍රවිඩ පාලකයා වන්නේ ,
   I. පනයමාර
   II. එළාර
   III. තිරිතර
   IV. පුලහත්ථ

10. පළමුවන විජයබාහු රජුගෙන් සිදු වූ සේවාව ඇගයීමේදී ප්‍රමුඛතාවය දිය යුත්තේ කුමන කරුණකටද?

I. අභාවයට ගොස් තිබූ වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
II. ඥාති සම්බන්ධතා මඟින් අසල්වැසි රාජ්‍යයන් සමඟ සුහදව කටයුතු කිරීම
III. සොළී පාලනයෙන් මෙරට මුදවා ගෙන ස්වාධීන රාජ්‍යයක් ගොඩ නැඟීම
IV. නටබුන්ව තිබූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම

## II කොටස

11. පහත රූපය නිරීක්ෂණය කර පිළිතුරු සපයන්න.



I. මේ කුමක්ද?
II. මෙයින් සිදු වන කාර්යය කෙටියෙන් හඳුන්වන්න.
III. මෙය භාරව සිටි නිලධාරියා කවුද?

12. කාන්තා දේශපාලන නියෝජනය පිළිබඳව කෙටි විස්තරයක් ලියා දක්වන්න.
13. රාජ්‍යත්වය හිමි වන ප්‍රධාන රාජ්‍යත්ව සංකල්ප නම් කර ඒවා පිළිබඳ කෙටි සටහන් ලියා දක්වන්න.
14. භාතිකාභය රජු පිළිබඳ කෙටි විස්තරයක් ලියා දක්වන්න.
15. පහත ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.

මහරජ ( මපුරුමුකා)

⇓

........................................

⇓

................................................ ..................+ සේනාපතිවරු (ශෙනපති )

⇓

........................ ( බඩගරික )

⇓

භෝජනාශාලා අධිකාරී ( බතගු )

⇓

..................................................( කොතුරු ගෑ නා )

⇓

............................ (........................)

****

# ඒකකය - ශ්‍රී ලංකාවේ පැරණි සමාජය

ඒ.පී.ආර්.අයේෂා ලක්මාලි (0712670476) - ශ්‍රී ලං.ගු.සේ. - අම්/අඹගහවැල්ල මහා විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 05

01. ඕනෑම රටක් පාලනය කරනු ලබන / මෙහෙයවනු ලබන ආයතන ත්‍රිත්වය වන්නේ,
    I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අධිකරණය, පාර්ලිමේන්තුව
    II. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණය
    III. පාර්ලිමේන්තුව, අධිකරණය, පළාත් සභාව
    IV. ව්‍යවස්ථාදායක, පාර්ලිමේන්තුව, අධිකරණය

02. වර්තමාන ශ්‍රී ලංකාවේ "පාර්ලිමේන්තුව" අයත් වන ආයතනය වන්නේ
    I. අධිකරණය II. ව්‍යවස්ථාදායකය III. විධායකය IV. පාර්ලිමේන්තුව

03. නීතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය වන්නේ ,
    I. ව්‍යවස්ථාදායකය II.පරිපාලන ආයතනය III. පොලිසිය IV. අධිකරණය

04. යුක්තිය පසිඳලනු ලබන ආයතනය හඳුන්වනු ලබන විශේෂිත නාමය වන්නේ,
    I. පාර්ලිමේන්තුව II. විධායකය III. අධිකරණය IV. ව්‍යවස්ථාදායක

05. ව්‍යවස්ථාදායකය හා විධායකය හැඳින්වීමට ක්‍රි.ව. 9 වන සියවසේදී සෙල්ලිපි වල භාවිතා කර ඇති සුවිශේෂී නාමය වන්නේ ,
    I. මහලේ II. වත්හිමි III. එක්තැන්සමිය IV. රාජසභාව

06. "වත්හිමි" ලෙසින් හඳුන්වා ඇත්තේ ,
    I. ප්‍රාදේශීය පාලකයෙක් හැඳින්වීමට භාවිතා කරන ලදි.
    II. රජු හැඳින්වීමට යොදා ගත් පර්යාය පදයකි.
    III. සෙන්පතිවරු හැඳින්වීමට යොදා ගන්නා ලදී.
    IV. මහලේකම් හැඳින්වීමට යොදන ලදී.

07. රජයේ ඉඩම් බෞද්ධ විහාර වෙත පිරිනැමීමේ කටයුත්තට පැමිණි ඇතැම් නිලධාරීන් නියෝජනය කරන ස්ථානය ක්‍රි.ව. 9 වන සියවසේ සෙල්ලිපි වලට අනුව හඳුන්වා ඇත්තේ ,
    I. වත්හිමි නමිනි. III. සභාව නමිනි.
    II. එක්තැන්සමිය නමිනි. IV. මහලේ නමිනි.

08. "දසගම් ඇත්තන්" යනුවෙන් හඳුන්වා ඇත්තේ ,
    I. පුද්ගලයන් දෙනෙක් III. සෙන්පතිවරු දස දෙනෙක්
    II. රජවරරු දස දෙනෙක් IV. ප්‍රාදේශීය මට්ටමේ පරිපාලන මණ්ඩල

09. වෙජ්ජසාලා යනුවෙන් හඳුන්වා ඇත්තේ,
    I. පාසල් II. ආරෝග්‍යශාලා III. පන්සල් IV. රජයේ ආයතන

10. වල්ලිපුරම් රන් සන්නස ලියන ලද්දේ,
    I. පළමුවන පරාක්‍රමබාහු රජු III. නිශ්ශංකමල්ල රජු
    II. වසභ රජු IV. සද්ධාතිස්ස රජු

11. පළාත් පාලනය සම්බන්ධයෙන් වල්ලිපුරම් රන් සන්නස තුළ අන්තර්ගත වන කරුණු මොනවාද?

12. අතීතයේ මෙරට සිටි වෙළඳුන් විසින් භික්ෂූන් වහන්සේලා හට වාසය කිරීම සඳහා ගල්ගුහා පූජා කරන ලද බව දැක්වෙන තොරතුරු ලියා දක්වන්න.

13. සෞඛ්‍ය පහසුකම් සම්බන්ධ සේවය කරන ලද රජවරුන් පිළිබඳ තොරතුරු ලියා පහත වගුව සම්පූර්ණ කරන්න.

| සේවය කරන ලද රජු | කරන ලද සේවය |
|---|---|
| iv වන කාශ්‍යප රජු | |
| බුද්ධදාස රජු | |
| V වන මහින්ද රජු | |
| i වන උපතිස්ස රජු | |

14. අතීතයේදී රජවරුන් පවත්වන ලද රාජ්‍ය තාන්ත්‍රික විදේශ සම්බන්ධතා හා බැඳුණු රජුගේ නම ඉදිරියෙන් ලියා දක්වන්න.
- පත්තිනි දේවාලයක් විවෘත කිරීමට චේර රාජ්‍යයට ගිය බව සෙල්ලිපි වල සඳහන් වන රජු
- රෝමානුක දේශයට තානාපති නිලධාරීන් යවා රුවන්වැලි මහා සෑයට පූජාවක් පැවැත්වීමට අවශ්‍ය වීදුරු පබලු රැගෙන ඒමට යවන ලද රජු

15. අතීත රජවරුන් විසින් විවාහ සම්බන්ධතා පවත්වා ගෙන ගිය බවට උදාහරණ දෙකක් ලියා දක්වන්න.

16. හේන් වගාව සිදු කරන විට ගැමියන්ගෙන් රජයට අය විය යුතු බදු වර්ග තුනක් පිළිබඳව ඉතිහාසයේ සඳහන් වේ. ඒ මොනවාද?

17. වී ගොවිතැන සිදු කරන ලද ප්‍රධාන කන්න වර්ග දෙක ලියන්න.

18. අතීතයේ මෙරට පැවති කර්මාන්ත 5ක් ලියා දක්වන්න.

19. අතීත ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධ තොරතුරු ආශ්‍රය කර ගනිමින් පහත ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.




20. හේන් ගොවිතැන සම්බන්ධයෙන් පහත වචන වල තේරුම් ලියා දක්වන්න
- නවදැලි හේන
- කනත්ත
- පැල
- දඬුවැට

21. කර්මාන්ත ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| කර්මාන්තය | ශිල්පීන් හඳුන්වන ලද අතීත නම |
|---|---|
| යකඩ කර්මාන්තය | |
| රන් කර්මාන්තය | |
| මැටි කර්මාන්තය | |
| තඹ කර්මාන්තය | |
| මැණික් කර්මාන්තය | |

22. තෝනිගල සෙල්ලිපියේ වී ගොවිතැන පිළිබඳව කරුණු දක්වා ඇති අතර එහි සඳහන් වන වී වගා කරන කන්න 03, අතීත නාමයන් සමඟ ලියා දක්වන්න.

23. ඇත් දළ කැටයම් කර්මාන්ත පිළිබඳ තොරතුරු අන්තර්ගත වන මූලාශ්‍රයක් හා එහි පවතින උදාහරණයක් ලියන්න.

24. මෙරටින් හමු වූ දෙමළ සෙල්ලිපි වලින් අනාවරණය වන වෙළඳ කණ්ඩායම් 3ක් ලියා දක්වන්න.

25. වෙළඳාමේ නියුතු පුද්ගලයින්, පිරිස් හඳුන්වා ඇත්තේ කෙසේද?

26. අතීත ශ්‍රී ලංකාවේ පැවති වාර්ගික සහජීවනය පිළිබඳව පෙළ පොත ඇසුරු කර ගනිමින් තොරතුරු සොයා පුවත්පතකට ගැළපෙන අයුරින් ලිපියක් සකස් කරන්න.

**(ඉතිරිය කාර්ය පත්‍රිකා අංක 10 අවසානයේ)**

# ඒකකය - ශ්‍රී ලංකාවේ පැරණි විද්‍යාව හා තාක්ෂණය

කේ.ඒ.අනෝමා රණසිංහ මිය (0771717815)- ශ්‍රී ලං.ගු.සේ. - අම්/ඩී.එස්.සේනානායක ජාතික පාසල

## කාර්ය පත්‍රිකා අංක 06

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවේ නිවාස ඉදිකිරීම් පිළිබඳ පැහැදිලි සාක්ෂි අපට පෙනෙන්නේ,
    I. පූර්ව ඓතිහාසික යුගයේ දීය.
    II. ප්‍රාග් ඓතිහාසික යුගයේ දීය.
    III. මධ්‍ය යුගයේ දීය.
    IV. ඓතිහාසික යුගයේ දීය.

02. සොරොව්වේ දණ්ඩ පාලනය කරන දණ්ඩ සකස් කොට යන්න හැඳින්වෙන 'මොහොල්නහා' යන පදය සඳහන් වන්නේ,
    I. නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත සෙල්ලිපියේ
    II. හතරවන මහින්ද රජුගේ වෙස්සගිරි ලිපියේ
    III. පළමුවන විජයබාහු රජුගේ පනාකඩු තඹ සන්නසේ
    IV. පස්වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ

03. ගංගා හරස් කර අමුණු බැඳ ජලය රැස් කර ගැනීමත්, එසේ රැස්කර ගන්නා ජලය වැව් වෙත ගෙන යාමත් ඉතා ඈත පුරාණයේ අප රටේ පැවති ජල කළමනාකරණ තාක්ෂණයකි. මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස් කර ඉදි කර ඇති ඇළ මාර්ගය වනුයේ,
    I. මිනිපේ ඇළ
    II. යෝධ ඇළ
    III. රිදීබැදි ඇළ
    IV. ඇළහැර ඇළ

04. ක්‍රි.පූ. 2400 ට දින නිර්ණය කර තිබෙන සොහොන් ගැබක තිබී යබොර කැබැල්ලක් සොයා ගෙන ඇත. මේ අනුව පුරාණ කාලයේ සිට යකඩ උණු කිරීමේ තාක්ෂණය දැන සිටි බවට සාක්ෂි හමු වී ඇති ස්ථානය වන්නේ,
    I. ඌව පළාතේ බෙරගලින්
    II. රත්නපුරයේ බලංගොඩින්
    III. උඩ රංචාමඩම ප්‍රදේශයෙන්
    IV. සීගිරියට නුදුරු අලකොලවැවින්

05. ක්‍රි.පූ. 3 වන සියවසේ දී සමනල වැව යකඩ නිස්සාරණය සඳහා යොදා ගෙන තිබෙන උඳුන් දැල්වීමට භාවිත කර ඇත්තේ,
    I. ස්වභාවික සුළං බලයයි.
    II. ගල් අඟුරු
    III. මරං ගස්වලින් ලබා ගන්නා දර
    IV. ලිමොනයිට් හ හෙමටයිට් ගල්

06. ක්‍රි.ව. 3 වන සියවසට අයත් පැරණි දේවාලයක නටබුන් මතු සඳහන් කුමන ඉදි කිරීමක් සඳහා ද?
    I. අභයගිරි කැණීම්වල දී
    II. ජේතවනාරාමය ඉදි කිරීම.
    III. සීගිරි කැණීම්වල දී
    IV. රත්නපුර ගල්පාය ප්‍රදේශයෙන්

07. අතීතයේ ගව්ව යන මිනුම භාවිත කරන ලද්දේ,
    I. බර මැනීමට ය.
    II. කාලය මැනීමට ය.
    III. දුර මැනීමට ය.
    IV. වපරිසය මැනීමට ය.

08. ස්ථාන කිහිපයකින් ම අමුණු බැඳ දුරකට ඇළ මාර්ග මගින් ජලය ගෙන යාම සඳහා යොදා ගත් ගංගාව මින් කුමක්ද?
    I. කලා ඔය
    II. යාන් ඔය
    III. මහවැලි ගඟ
    IV. මල්වතු ඔය

09. මින්නේරිය, ගිරිතලේ, කවුඩුලු හා කන්තලේ යන වැව්වලට ජලය ගෙන ගිය ඇළ මාර්ගය වනුයේ,
    I. මිනිපේ ඇළ
    II. මාදුරු ඔය
    III. ඇලහැර ඇළ
    IV. යෝධ ඇළ

10. ක්‍රි.පූ.දෙවන සියවසට අයත් සෙල්ලිපියක අඩික නමින් හැඳින්වෙන නිලධාරියකු ගැන සඳහන් වේ. ඔහුගේ රාජකාරිය වනුයේ,

I. බදු අය කර ගැනීම.
II. ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධව
III. ඇත්දත් කැටයම් කිරීම.
IV. වෙළෙන්දන්

## II කොටස

❖ පහත ප්‍රශ්නවලට පිළිතුර ලියන්න.

01. විශාල වැව් කිහිපයකට උදාහරණ ලියන්න.
02. වැවක කොටස් නම් කරන්න.
03. ජලමල් නිර්මාණය කුමකට සම්බන්ධ ද?
04. ආදී ගෘම නිර්මාණ නම් කරන්න.
05. චෛත්‍යවලට උදාහරණ ලියන්න.
06. රුවන්වැලි සෑය කළ රජතුමා කවුද?
07. සිවිකා ශාලා යනු කුමක් ද? (මහාවංශය)
08. ඓතිහාසික මූලාශ්‍රවල අකුණු සන්නායක උපකරණය හඳුන්වා තිබෙන්නේ කුමන නමකින් ද?
09. වර්තමාන විද්‍යාවට අනුව එදා රුවන්වැලි සෑය ස්ථූපය ගොඩ නැඟීමේදි යොදා ගත් විද්‍යා තාක්ෂණ අවස්ථා 02 ක් ලියන්න.
10. සීගිරිය නිර්මාණය උසස් බව දක්නට ඇති සාධක ලියන්න.
11. අතීතයේ ලංකාවේ සනීපාරක්ෂාව ස්වස්ථතාව වෛද්‍යක්‍රමය විස්තර කරන්න.
12. පුරාණ තාක්ෂණය පිළිබිඹු කරන අවස්ථා 2ක් වාස්තු විද්‍යාව ඇසුරින් පැහැදිලි කරන්න.
13. පුරාණ කාලයේ යකඩ නිස්සාරණ තාක්ෂණය විස්තර කරන්න.
14. අතීතයේ පැවති සුළු කර්මාන්ත නම් කරන්න.
15. අතීතයේ පැවති දේශීය චාරිත්‍ර වත්පිළිවෙත් ලියන්න.
16. එදා අමුණක් ලෙස භාවිතා වූ ප්‍රමාණය අද අක්කර වලින් කොපමණ ද?
17. පැරණි මිමි ක්‍රම ලියන්න.
18. ඉහත මිනුම් ක්‍රම තහවුරු කළ හැකි සෙල්ලිපි 02 ක් ලියන්න.
19. දිග මැනීම සඳහා යොදා ගන්නා ගණිත චක්‍රය ලියන්න.
20. පුරාණ කාලයේ ශ්‍රී ලංකාවේ භාවිත වූ බර මැනීමේ මිනුම් ක්‍රමවල ස්වරූපය දැක්වෙන චක්‍රය ලියන්න.
21. දැදිගම ඇත්පහන සොයාගෙන ඇත්තේ කොහෙන් ද?
22. අතීතයේ අපේ ආදී මුතුන් මිත්තන් තාක්ෂණය යොදාගත් ආකාරය ලියන්න.
23. ඓතිහාසික සමාජ සංවිධානය මැනවින් සංවිධානය වූ අතර එහි ධූරාවලියක් විය. එම ධූරාවලියේ තිබූ තනතුරු ලියන්න.
24. මෙම සමාජයේ රජතුමාගේ ගතිගුණ හා ලක්ෂණ ලියන්න.
25. රජුට සමීපව කටයුතු කළ රාජකීය නිලධාරීන් මහනුවර යුගයේ දී හඳුන්වන නාමය ලියන්න.

****

# ඒකකය - ඓතිහාසික දැනුම සහ එහි ප්‍රායෝගික ආදේශනය

කේ.ඒ.සිරිලාල් (0770270073)- ශ්‍රී ලං.ගු.සේ. - අම්/උදයපුර විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 07

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බිහි වූ පැරණි නගරයන් අතර පළමුවන නාගරීකරණ ලක්ෂණ පිළිබිඹු වන්නේ,

I. අනුරාධපුරය හා පොළොන්නරුව යන නගරවලිනි.
II. මාගම හා කොට්ටේ යන නගරවලිනි.
III. පොළොන්නරුව හා යාපනය යන නගරවලිනි.
IV. අනුරාධපුර හා මාගම යන නගරවලිනි.

02. ශ්‍රී ලංකාවේ පළමුවන නාගරීකරණයට අයත් නගරයන්හි නගර වර්ධනය වීමේ මූලික ලක්ෂණ දක්නට ලැබෙනුයේ,

I. ක්‍රි.ව. 2600 දී ය.
II. ක්‍රි.පූ. 450 දී ය.
III. ක්‍රි.ව. 3 වන සියවසේදී ය.
IV. ක්‍රි.පූ. 2400 දී ය.

03. පැරණි ජන සමාජය තුළ පරුමකවරුන්ට ඉහළ පිළිගැනීමක් තිබිණි. ඔවුන් සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

I. ගෘහයේ ප්‍රධානියා විය.
II. ප්‍රාදේශීය පාලනයේ ප්‍රධානියා විය.
III. ජාතකට්ඨ කතාවේ මොවුන් පිළිබඳව සඳහන් වේ.
IV. ආර්ථික වශයෙන් සමෘද්ධිමත් පිරිසකි.

04. නිෂ්පාදන අතිරික්තයට හිමිකම් කී ප්‍රභූ පවුල් තමන්ගේ කීර්ති නාමය පවත්වාගෙන යාම සඳහා එකල අනුගමනය කළ ක්‍රමවේදය පිළිබඳව පුරාවිද්‍යා කැණීම් වලින් විශද වේ. එමගින් තහවුරු වන්නේ ඔවුන්,

I. භික්ෂූන් වහන්සේලාට දාන මාන දීම පිළිබඳවය.
II. භික්ෂූන් වහන්සේලාට ලෙන් පූජා කිරීම පිළිබඳවය.
III. විදේශයන්හි සංචාරය කිරීම පිළිබඳවය.
IV. විදේශීය භාණ්ඩ පරිහරණය කිරීම පිළිබඳවය.

05. වසර 1400 කට අධික කාලයක් ශ්‍රී ලංකාවේ අගනගරය වශයෙන් වියළි කලාපයේ පැවති පැරණි නගරය වන්නේ,

I. පොළොන්නරුව
II. අනුරාධපුරය
III. කෝට්ටේ
IV. මහනුවර

06. අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා ලෙස සලකනු ලබන්නේ,

I. දුටුගැමුණු රජතුමා
II. හතරවන මිහිඳු රජතුමා
III. පස්වන මිහිඳු රජතුමා
IV. විජයබාහු රජතුමා

07. පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා ලෙස හඳුන්වනු ලබන්නේ,

I. පළමුවන පරාක්‍රමබාහු රජතුමා
II. පස්වන මිහිඳු රජතුමා
III. පළමුවන විජයබාහු රජතුමා
IV. නිශ්ශංක මල්ල රජතුමා

08. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගෙන් පසුව වසර 9ක කාලයක් මෙරට ශක්තිමත් පාලනයක් ගෙන ගිය රජතුමා / රැජින වන්නේ,

I. දෙවන පරාක්‍රමබාහු රජතුමා
II. ලීලාවතී බිසව
III. පළමුවන විජයබාහු රජතුමා
IV. නිශ්ශංක මල්ල රජතුමා

09. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බල පෑ ආසන්නම හේතුව වූයේ,

I. ආර්ථික පරිහානියයි.
II. කාලිංග පාණ්ඩ්‍ය බල අරගලය යි.
III. ස්වාභාවික ව්‍යසනයයි.
IV. කාලිංග මාඝගේ ආක්‍රමණයි.

10. පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමෙන් පසුව දඹදෙණි රාජධානිය පිහිටවනු ලබන්නේ,

I. දෙවන පරාක්‍රමබාහු රජතුමාය.
II. සිව්වන පරාක්‍රමබාහු රජතුමාය.
III. තුන්වන විජයබාහු රජතුමාය.
IV. පළමුවන බුවනෙකබාහු රජතුමාය.

## II කොටස

01. පැරණි නගරවල ස්වභාවය අනුව කොටස් ගණන නම් කර වෙන වෙනම හඳුන්වන්න.

02. දීර්ඝ කාලයක් තිස්සේ අනුරාධපුර නගරය දිවයිනේ අගනගරය ලෙස ක්‍රියාත්මක වීමට බල බෑ හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පොළොන්නරු රාජධානිය පළමු වරට සිය පාලන මධ්‍යස්ථානය කර ගැනීමට විජයබාහු රජතුමාට බල පෑ හේතු පැහැදිලි කරන්න.

04. පොළොන්නරු රාජධානිය ආර්ථික වශයෙන් පරිහානියට බල පෑ හේතු පැහැදිලි කරන්න.

05. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බල පෑ හේතු තුනක් පැහැදිලි කරන්න.

****

# ඒකකය - වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නිරිතදිග නව රාජධානි බිහිවීම

ලක්මාලි දිසානායක (0715996659)- ශ්‍රී ලං.ගු.සේ. - අම්/කහටගස්යාය විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 08

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශ්‍රී ලංකාවේ පළමුවැනි නාගරීකරණය පිළිබිඹු වන්නේ,
   I. පොලොන්නරුව හා විජිතපුරයෙනි.
   II. මහනුවර හා අනුරාධපුර අනුරාධපුරයෙනි.
   III. මාගම හා පරාක්‍රමපුරයෙනි.
   IV. අනුරාධපුරය හා මාගම නගරයෙනි.

2. ගෝවින්දමලය, යාපහුව, ගඟ දෙනිය ආශ්‍රිතව බලකොටු තනා ගනිමින් මාඝගෙන් ජනතාව ආරක්ෂා කළ නායකයින් පිළිවෙළින් දැක්වෙන්නේ,
   I. සංක සෙනවි, බුවනෙකබාහු ආදිපාද, අම්බුලුගල කුමරු
   II. සුභ සෙනවි, බුවනෙකබාහු ආදිපාද, සංඛ සෙනෙවි
   III. බුවනෙකබාහු ආදිපාද, සුභ සෙනවි, සංඛ සෙනවි
   IV. සපුමල් කුමරු, නිශ්ශංක අලගක්කෝනාර, සංඛ සෙනවි

3. කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් හැඳින්වූයේ,
   I. සිව්වන පරාක්‍රමබාහු රජු
   II. පළමුවන පරාක්‍රමබාහු රජු
   III. දෙවන පරාක්‍රමබාහු රජු
   IV. තුන්වන පරාක්‍රමබාහු රජු

4.
   • කෝට්ටේ බළකොටුවක් නිර්මාණය කිරීම.
   • රජුගේ ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කිරීම.
   • ආර්ය චක්‍රවර්ති රජුගේ රජුගේ බදු නිලධාරීන්ට දඬුවම් කිරීම.

ඉහත සිද්ධියෙන් හා සම්බන්ධ වන පුද්ගලයා වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | සපුමල් කුමරු | III. | නිශ්ශංක අලකේශ්වර |
| II. | කන්නසාමි කුමරු | IV. | සේනාධිලංකාර |

5.

| | |
|---|---|
| 1. විජයබා පිරිවෙන | a කැරගල |
| 2. පද්මාවතී පිරිවෙන | b තොටගමුව |
| 3. සුනේත්‍රා දේවි පිරිවෙන | c පැපිලියාන |
| 4. ඉරුගල් කුලතිලක පිරිවෙන | d දෙව්නුවර |

ඉහත අවස්ථා නිවැරදිව ගැළපූ විට,

| | | | |
|---|---|---|---|
| I. | bcda | III. | dbca |
| II. | dcab | IV. | bacd |

6.

| | |
|---|---|
| 1.පළමු බුවනෙකබාහු | a ගම්පොල |
| 2. හයවන පරාක්‍රමබාහු | b දඹදෙණිය |
| 3 තුන්වන විජයබාහු | c යාපහුව |
| 4 තුන්වන වික්‍රමබාහු | d කෝට්ටේ |

ඉහත අවස්ථා නිවැරදිව ගැළපූ විට,

| | | | |
|---|---|---|---|
| I. | abcd | III. | bdca |
| II. | cdba | IV. | cbad |

7. ගම්පොළ රාජධානි සමයේ සමයට අදාළ සිදුවීමක් නොවන්නේ,
   I. ඉබන් බතූතා නම් අරාබි සංචාරකයෙකු පැමිණීම.
   II. ආර්ය චක්‍රවර්තින්ගේ ආක්‍රමණය.
   III. පන්සියය පනස් ජාතක පොත සිංහලට පරිවර්තනය කිරීම.
   IV. චීනයේ යුන් ලෝ අධිරාජ්‍යයාගේ චෙන් හෝ නම් සෙන්පතියාගේ පැමිණීම.

8. යාපනයේ රාජධානියේ ආරම්භක පාලකයා වූයේ,
   I. කුලසේකර
   II. ආර්ය චක්‍රවර්තී
   III. සංබලි
   IV. වරෝදය

9. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ කාව්‍යයක් නොවන්නේ,
   I. මයුර සන්දේශය
   II. හංස සන්දේශය
   III. සැළලිහිණි සන්දේශය
   IV. ගිරා සන්දේශය

10. ලංකාතිලක විහාරය කරවන ලද්දේ,
   I. පළමුවන බුවනෙකබාහු
   II. සිව්වන බුවනෙකබාහු
   III. දෙවන බුවනෙකබාහු
   IV. තුන්වන බුවනෙකබාහු

## II කොටස

1.
   I. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත් පරිපාලන නගර තුනක් දක්වන්න.
   II. පළමු නාගරීකරණයේ පැරණි නගර පිරිහීමට බලපෑ හේතු හතරක් දක්වන්න.
   III. දෙවන පරාක්‍රමබාහු රජුට මුහුණ දීමට සිදු වූ ආක්‍රමණ දෙකක් දක්වන්න.

2.
   I. ඊජිප්තුව සමග වෙළඳ සබඳතා සඳහා දූතයන් යැවූ රජු කවුද ?
   II. පාණ්ඩ්‍ය හමුදාව මෙරටින් පැහැරගෙන ගිය දළදාව නැවත මෙරටට ගෙන ආ රජු කවුරුන්ද?
   III. කුරුණෑගල රාජධානි සමයේ පැවති සාහිත්‍ය නවෝදය විස්තර කරන්න.

3.
   I. ගාල්ලේ ත්‍රී භාෂා ලිපියේ සඳහන් භාෂා මොනවාද ?
   II. හයවන පරාක්‍රමබාහු රජුගෙන් ඉටු වූ සේවාවන් විස්තර කරන්න.
   III. දැදිගම සෙල්ලිපිය පිහිටුවා ඇත්තේ කිනම් කරුණක් සඳහා ද ?

4.
   I. යාපනය රාජධානිය පිළිබඳ තොරතුරු හැදෑරීමට ඇති මූලාශ්‍ර මොනවාද?
   II. යාපනය රාජධානිය යටත් කළ කෝට්ටේ පාලකයා කවුද?
   III. වන්නියාර්වරුන් නමින් හැඳින්වූයේ කවුරුන්ද?

5.
   I. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කුමක්ද ?
   II. දෙවන නාගරීකරණ සමයේ ගෘහ නිර්මාණ කුමන ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය ලැබුවේ ද ?
   III. දෙවැනි නාගරීකරණ අවධියේ ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ ඇති වූ වෙනස්කම් තුනක් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

6.
   I. ශ්‍රී ලංකාවේ පළමු නාගරීකරණයට අයත් පැරණි පරිපාලන නගර තුනක් දක්වන්න.
   II. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ඇතිවූ රාජධානියේ නම කුමක්ද?
   III. එම රාජධානිය පාලනය කළ පාලකයින් හැඳින්වූ නම කුමක්ද ?

****

# ඒකකය - මහනුවර රාජධානිය

එච්.එම්.පී.පී.ගුණවර්ධන මිය (0713748250)- ශ්‍රී ලං.ගු.සේ. - අම්/සිවලී විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 09

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) උඩරට නව රාජවංශයක් බිහි කරමින් මහනුවර රාජධානිය ශක්තිමත් කළ පාලකයා කවුද?
1. I වන රාජසිංහ රජු
2. I වන විමලධර්මසූරිය රජතුමා
3. II වන රාජසිංහ රජු
4. සෙනරත් රජතුමා

(2) පළමු වන විමලධර්මසූරිය රජතුමාට උඩරට රාජ්‍යයට ඇති නීත්‍යානුකූල උරුමය තහවුරු වූයේ,
1. දන්තුරේ සටනින් පෘතුගීසීන් පරාජය කිරීමෙනි.
2. කුසුමාසන දේවිය අග මෙහෙසිය කර ගැනීමෙනි.
3. උඩරට රාජ්‍ය තුළ සංවිධානාත්මක පාලන ක්‍රමයක් ඇති කිරීමෙනි.
4. උඩරට ප්‍රධානීන්ට තෑගි බෝග පිරිනමා තම පක්ෂයට හරවා ගැනීමෙනි.

(3) ශ්‍රී ලංකාවේ මහනුවර රාජධානියේ අවසාන සිංහල රජතුමා වන්නේ,
1. රාජාධිරාජසිංහ රජතුමා
2. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
3. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
4. ශ්‍රී විජය රජතුමා

(4) උඩරට රාජ්‍ය පාලනය කළ නායක්කාර වංශික රජ පෙළපතේ ආරම්භක පාලකයා කවුද?
1. රාජාධිරාජසිංහ රජතුමා
2. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
3. ශ්‍රී විජය රාජසිංහ රජතුමා
4. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

(5) පෘතුගීසීන්ට විරුද්ධව උඩරට රාජධානිය තුළ ගන්නෝරු සටන මෙහෙය වූ වර්ෂය හා රජතුමා දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ක්‍රි.ව. 1594 – I වන විමලධර්මසූරිය රජු
2. ක්‍රි.ව. 1630 – සෙනරත් රජතුමා
3. ක්‍රි.ව. 1638 – I වන රාජසිංහ රජතුමා
4. ක්‍රි.ව. 1766 – කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා

(6) උඩරට රාජධානියේ ක්‍රි.ව. 1766 වර්ෂයේ රජතුමා හා ලන්දේසීන් අතර සාම ගිවිසුමක් අත්සන් කළ උඩරට රජතුමා කවුද?
1. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
2. සෙනරත් රජතුමා
3. I වන රාජසිංහ රජතුමා
4. ශ්‍රී විජය රාජසිංහ රජතුමා

(7) මහනුවර රාජධානියේ මහා වාසල නිලධාරීන් ගණයට අයත් නොවන තනතුර කුමක් ද?
1. ගජනායක නිළමේ
2. මහ ලේකම්
3. අස් පන්තියේ මුහන්දිරම්
4. උණ්ඩිය රාළ

(8) මහනුවර රාජධානියේ සමාජ සංවිධාන හා සම්බන්ධ සාවද්‍ය පිළිතුර වන්නේ,
1. විවාහ කටයුතු කුල ක්‍රමය මත සිදු විය.
2. බොහෝ කටයුතු අත්තම් ක්‍රමයට සිදු විය.
3. ආර්ථික කටයුතු සියලුම කුල වලට පොදු විය.
4. ග්‍රාමීය සමාජ ක්‍රමයක් පැවතුණි.

(9) උඩරට රාජධානිය සම්බන්ධයෙන් සාවද්‍ය පිළිතුර තෝරන්න.
1. සම්ප්‍රදායට හා පෙර සිරිතට අනුව රජු කටයුතු කළ යුතුය.
2. සෑම නිලධාරියෙකුට ම තම පදවිය අනුව අධිකරණ බලතල හිමි වේ.
3. රටේ ඉහළම තැනැත්තා රජතුමාය.
4. ඉහළම අධිකරණ බලතල මහා අදිකාරම් සතුය.

(10) තම රාජධානිය තුළ ම අනාරක්ෂිත තත්වයට පත් වූ උඩරට රජතුමා කවරෙක් ද?
1. සෙනරත් රජතුමා
2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
3. ශ්‍රී විජය රාජසිංහ රජතුමා
4. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජතුමා

## II කොටස

❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1.(1) උඩරට රාජධානිය හැඳින්වූ වෙනත් නම් තුනක් ලියන්න.

(2) පහත A B C හා D වලින් දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ලියන්න.
A - දළදා මාළිගාවට පත්තිරිප්පුව නම් අංගය එක් කළ රජතුමා
B - උඩරට නව රාජවංශයක් ආරම්භ කළ රජතුමා
C - දෝන කතරිනා නමින් බෞතිස්ම ලැබූ සිංහල රාජ කුමරිය
D - ඉඟුරු දී මිරිස් ගැනීම සම්බන්ධ උඩරට රජතුමා

(3) උඩරට රාජධානියේ පළමුවන විමලධර්මසූරිය රජතුමාගේ ආගමික සේවාවන් දෙකක් පැහැදිලි කරන්න.

(4) පළමුවන විමලධර්මසූරිය රජතුමා තම ස්ථාවරත්වය ගොඩ නගා ගැනී අනුගමනය කළ කරුණු දෙකක් පැහැදිලි කරන්න.

2. (1) උඩරට රාජධානිය අගනුවර කර ගත් රජවරු තිදෙනෙක් නම් කරන්න.

(2) පහත A B C හා D වලින් දක්වා ඇති තොරතුර හා සම්බන්ධ පුද්ගලයින් ලියන්න.
A – I වන රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කරන විට පෘතුගීසී ආරක්ෂාව පැතූ උඩරට පාලකයා
B – පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසි සහය පැතූ පාලකයා
C – උපාලි හිමියන් සියම් දේශයට යවා මෙරට උපසම්පදාව පිහිට වූ පාලකයා
D - උඩරට රාජධානිය කොටස් තුනකට බෙදා පුත් කුමාරවරුන්ට පවරා දුන් රජතුමා

(3) දෙවන රාජසිංහ රජතුමාට මුහුණ පෑමට සිදු වූ අභියෝග දෙකක් පැහැදිලි කරන්න.

(4) උඩරට රාජධානියේ ආර්ථික රටාව සැකසී තිබූ ආකාරය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න.

3. (1) පහත දැක්වෙන පුද්ගලයින් උඩරට රාජ්‍යයේ රාජ්‍යත්වයට පත් වූයේ කුමන නම් වලින් ද?
A - කොනප්පු බණ්ඩාර
B - මහා අස්ථාන කුමරු
C - කන්නසාමි

(2) උඩරට රජතුමා විසඳූ නඩු වර්ග දෙකක් හා ලබා දුන් දඬුවම් වර්ග දෙකක් ලියන්න.

(3) උඩරට රාජධානියේ ඉඩම් අයිතිය හා භුක්තිය හිමි වූ ආකාරය පැහැදිලි කරන්න.

(4) මහනුවර රාජධානියේ පරිහානියට ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියා කලාපය හේතු වූ ආකාරය කරුණු දෙකකින් පැහැදිලි කරන්න.

4. (1) උඩරට රාජධානියට ආරක්ෂාව සැපයූ දුර්ග දෙක හා ගංගාව නම් කරන්න.

(2) උඩරට රාජධානියේ නායක්කාර වංශික රජවරු හතර දෙනා අනුපිළිවෙළට ලියන්න.

(3) උඩරට රාජධානිය පාලනය කළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ සේවාව කරුණු දෙකකින් සඳහන් කරන්න.

(4) උඩරට රාජධානියේ සමාජ සංවිධානය තුළ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න.

5. (1) උඩරට රාජධානියේ බද්දේ සංවිධානයට අයත් බදු වර්ග තුනක් ලියන්න.

(2) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න.
A - වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරි නැමූ රජතුමා
B - ක්‍රි.ව. 1796 ඉංග්‍රීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගන්නා විට උඩරට පාලනය කළ රජතුමා
C - ක්‍රි.ව. 1594 පෘතුගීසී අන්ත පරාජයට පත් වූ සටන
D - උඩරට රාජධානියේ ආරම්භක පාලකයා

(3) උඩරට රාජධානියේ ප්‍රාදේශීය පාලනය ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කරන්න.

(4) උඩරට රාජධානියේ අවසන් පාලකයා අතින් රජ පදවියේ ගෞරවය බිඳී ගිය ආකාරය කරුණු 03කින් පහදන්න.

6. (1) පළමු වන රාජසිංහ රජතුමා උඩරට ආක්‍රමණය කරන විට ආරක්ෂාව පතා පෘතුගීසීන් වෙත පලා ගිය පුද්ගලයින් තිදෙනා නම් කරන්න.

(2) උඩරට රාජධානියේ ප්‍රාදේශීය පාලනයට අයත් දිසාවන් දෙකක් හා රටවසම් දෙකක් නම් කරන්න.

(3) පළමු වන විමලධර්මසූරිය රජතුමාට තිබූ අභියෝග දෙකක් නම් කර ඒවා ජය ගත් ආකාරය නම් කරන්න.

(4) උඩරට රාජධානියට දෙවන රාජසිංහ රජතුමාගෙන් ඉටු වූ සේවාව පැහැදිලි කරන්න.

****

# ඒකකය - පුනරුදය

ඩී.පී.ආර්.යූ.කේ.අබේරත්න මිය (0770404990)- ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය,අම්පාර

## කාර්ය පත්‍රිකා අංක 10

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පුනරුදය මුලින්ම ආරම්භ වූයේ,
   - V. ඉතාලියෙ නි.
   - VI. එංගලන්තයෙ නි.
   - VII. ප්‍රංශයෙ නි.
   - VIII. පෘතුගාලයෙ නි.

2. මධ්‍යතන යුගයේ යුරෝපා රටවල භාවිතා වූ භාෂාව වන්නේ,
   - I. ග්‍රීක භාෂාව
   - II. ගෝත්‍රික භාෂාව
   - III. ඉංග්‍රීසි භාෂාව
   - IV. ලතින් භාෂාව

3. මානවවාදය යනු කුමක්දැයි විස්තර වන්නේ පහත කුමන පිළිතුරේ ද?
   - I. මානවවාදය මත ලෝකය පවතී.
   - II. මානවවාදය යනු මිනිසා උතුම්කොට සැලකීමයි.
   - III. මානවවාදය තුළින් ගැටුම් ඇති වෙයි.
   - IV. මිනිසාගේ පැවැත්මට මානවවාදය බාධාවකි.

4. පුනරුද සමයේ සිටි ගෘහ නිර්මාණ ශිල්පියෙකු නොවන්නේ කවුරුන්ද?
   - I. මයිකල් ඇන්ජලෝ
   - II. ෆ්‍රැන්සිස් බේකන්
   - III. ලියනාඩෝ ඩාවින්චි
   - IV. රෆායල්

5. යුරෝපා ජාතීන් අතරින් දේශ ගවේෂණයට මුලින්ම එක්වූ රටවල් දෙක වන්නේ,
   - I. ඕලන්දය හා පෘතුගාලය යි.
   - II. පෘතුගාලයේ හා ඉතාලිය යි.
   - III. පෘතුගාලය හා ස්පාඤ්ඤය යි.
   - IV. ඕලන්දය හා මහා බ්‍රිතාන්‍ය යි.

6. යුරෝපියන් ආසියාවට පැමිණීමට සොයාගත් මුහුදු මාර්ගය ඔස්සේ ප්‍රථමයෙන් ඉන්දියාවට පැමිණියේ,
   - I. වස්කෝද ගාමා
   - II. ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා
   - III. ක්‍රිස්ටෝපර් කොලොම්බස්
   - IV. බර්තොලමියුඩයස්

7. පුනරුද සමයේ චිත්‍ර ශිල්පියෙකු පමණක් නොව කවියෙකු සංගීතඥයකු විද්‍යාඥයකු මෙන්ම ප්‍රායෝගික ඉංජිනේරුවරයෙක් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූයේ,
   - I. මයිකල් ආන්ජලෝ
   - II. රෆායල්
   - III. ගැලිලියෝ ගැලිලි
   - IV. ලියනාඩෝ ඩාවින්චි

8. පුනරුද සමයේ පල්ලියේ ආධිපත්‍යය විවේචනය නොකළ අයෙකු වන්නේ මින් කවරෙක්ද?
   - I. ජෝන් වෙක්ලිප්
   - II. ජෝන් හස්
   - III. මාටින් ලූතර්
   - IV. තෝමස් මුවර්

9. පෘථිවිය ගෝලාකාර බවත් අනෙකුත් ග්‍රහලෝක සූර්යයා වටා පරිභ්‍රමණය වන බවත් සොයා ගත්තේ,
   - I. අයිසෙක් නිව්ටන්
   - II. නිකලස් කොපර්නිකස්
   - III. ගැලිලියෝ ගැලිලි
   - IV. ජොහැනස් කෙප්ලර්

10. සුදුසු පරිදි යා කර නිවැරදි පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| 1. මෙක්සිකෝව | A. කැබේ සහෝදරයෝ |
| 2. කැනඩාව | B. ෆර්නැන්ඩෝ කෝර්ටිස් |
| 3. නව ලෝකය | C. ක්‍රිස්ටෝපර් කොලම්බස් |
| 4. බටහිර ඉන්දීය දූපත් | D.ඇමරිගෝ වෙස්පුචි |

I. BDCA
II. ACDB
III. BADC
IV. BDAC

## II කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

11. පුනරුදය යනු කුමක්ද?

12. පුනරුදය ඇති වීමට බලපෑ හේතු මොනවාද?

13. පුනරුද ඉතාලියෙන් ආරම්භ වීමට බලපෑ හේතුව කුමක්ද?

14. ශාස්ත්‍රීය පුනරුදයේ යනු කුමක්ද?

15. තුර්කි ජාතිකයන් කොන්ස්තන්තිනෝපල් නගරය යටත් කර ගත්තේ කුමන වර්ෂයේද?

16. යුරෝපා පුනරුද සමයේ කලා නිර්මාණ ඉදිරිපත් කළ පුද්ගලයින් තුනක් නම් කරන්න.

17. මොනාලිසා චිත්‍රය නිර්මාණය කරන ලද්දේ කුමන ශිල්පියාද?

18. ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම භෝජන සංග්‍රහය නිර්මාණය කළ ශිල්පියා කවුද?

19. යුරෝපා ජාතීන්ට නව මුහුදු මාර්ග සොයා ගැනීමේදී ගමන සාර්ථක කර ගැනීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න.

20. පුනරුද සමයේ යුරෝපයේ ආර්ථික කටයුතු වල නවෝදය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

21. මයිකල් ආන්ජලෝ නිර්මාණය කළ ප්‍රතිමා හතරක් සඳහන් කරන්න.

22. පුනරුද සමයේ ගෘහ නිර්මාණ කලාවේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

23. පුනරුදය ගෝලීය ප්‍රවණතාවක් ලෙස සලකන්නේ කුමක් නිසාද?

24. දේශ ගවේෂණ කටයුතු සඳහා උනන්දු වූ සාගරබද රටවල් දෙකක් නම් කරන්න.

25. පුනරුද සමයේ ගෘහ නිර්මාණ ශිල්පය මැනවින් පිළිබිඹු කරන ගොඩනැගිලි වලට උදාහරණ තුනක් ලියන්න.

26. නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හඳුන්වන්නේ කවුරුන්ද?

27. නව ලෝකය යනුවෙන් හඳුන්වනු ලබන රට සොයාගත් පුද්ගලයා කවුරුන්ද?

28. පුනරුද සමයේ ඉතා පුළුල් වෙනසකට ලක් වූ කලාව කුමක්ද?

29. මයිකල් ඇන්ජලෝගේ කලා නිර්මාණ හතරක් ලියන්න.

30. පහත සඳහන් රටවල සාහිත්‍ය ක්ෂේත්‍රයට දායකත්වය දැක්වූ දැක්වූ ලේඛකයන් ලියා දක්වන්න.

I. ඉතාලිය

II. එංගලන්තය

III. ප්‍රංශය

31. පුනරුද සමයේ යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් තුනක් ලියන්න.

32.

I. ලියනාඩෝ ඩාවින්චි විසින් නිර්මාණය කරන ලද කලා නිර්මාණ තුනක් ලියන්න.

II. ඔබ කැමති කලා නිර්මාණයක් ගැන විස්තරයක් කරන්න.

33. පුනරුද සමයේ දේශපාලන හා ආර්ථික නවෝදය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

34. පුනරුදය ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බලපෑ ආකාරය කරුණු තුනකින් විස්තර කරන්න.

35. පුනරුද සමයේ පහත ක්ෂේත්‍ර හා සම්බන්ධ අය හඳුන්වන්න.

I. දක්ෂ චිත්‍ර හා මූර්ති ශිල්පියෙක්

II. තර්ක විද්‍යාවේ පියා

III. අත්හදා බැලීමේ පියා

IV. ගත් කතුවරයෙකු

36. පුනරුදය ශ්‍රී ලංකාව කෙරෙහි සිදු කරන ලද බලපෑම් බලපෑම කෙසේදැයි විස්තර කරන්න.

****

**කාර්ය පත්‍රිකා අංක 06හි ඉතිරි කොටස**

27. පහත රූප හොඳින් අධ්‍යයනය කර පිළිතුරු සපයන්න.



I. මෙම ගොඩනැගිල්ල කුමක්ද?
II. පිහිටා ඇත්තේ කොහේද?
III. කුමන ආගමක් හා සම්බන්ධ වේද?



I. මෙම රූපයේ සිටින කාන්තාවන් හඳුන්වන්නේ කෙසේද?
II. මෙම රූප අඩංගු ස්ථානය කුමක්ද?
III. මෙම චිත්‍ර කුමන සියවසකට අයත් වේද ?
IV. මෙම චිත්‍ර ඇතුළත් බලකොටුවේ නිර්මාතෘවරයා කවුරුන්ද?

****

# ඒකකය - ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

ඩී.පී.ආර්.යූ.කේ.අබේරත්න මිය (0770404990)- ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය,අම්පාර

## කාර්ය පත්‍රිකා අංක 11

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ආසියාව හා යුරෝපය අතර වෙළඳ සබඳතා පැවතුණු ප්‍රධාන මාර්ග තුන සම්බන්ධ වූ නගරය වන්නේ,
   - I. තුර්කිය
   - II. කොන්ස්තන්තිනෝපල්
   - III. ඕලන්ද
   - IV. පෘතුගාලය

2. ඉස්ලාම් ආගම ඇදහූ තුර්කි ජාතිකයන් විසින් කොන්ස්තන්තිනෝපල් නගරය යටත් කර ගත් වර්ෂය වන්නේ,
   - I. 1453
   - II. 1543
   - III. 1435
   - IV. 1452

3. පෘතුගාලය පිහිටා ඇති අර්ධද්වීපය වන්නේ,
   - I. ඉන්දියන් අර්ධද්වීපය
   - II. මලයාසියා අර්ධද්වීපය
   - III. අයිබීරියන් අර්ධද්වීපය
   - IV. යාපන අර්ධද්වීපය

4. ශ්‍රී ලංකාවට පැමිණි මුල්ම පෘතුගීසි කණ්ඩායම වන්නේ
   - I. වස්කෝද ගාමා කණ්ඩායම
   - II. කැලිකට් සැමරුන් කණ්ඩායම
   - III. ලොරෙන්සෝ ද අල්මේදා කණ්ඩායම
   - IV. ක්‍රිස්ටෝපර් කොලොම්බස් කණ්ඩායම

5. මුල්ලේරියා සටනට සම්බන්ධ හමුදා කණ්ඩායම් දෙක වන්නේ,
   - I. සිතාවක හා පෘතුගීසි හමුදාව
   - II. සීතාවක හා ලන්දේසි හමුදාව
   - III. වස්කෝද ගාමා හා පෘතුගීසීන්
   - IV. රන්දෙණිගල කණ්ඩායම හා පෘතුගීසි කණ්ඩායම

6. දන්තුරේ සටනට නායකත්වය සැපයූ පෘතුගීසි සෙන්පතියා ලෙස සැලකෙන්නේ,
   - I. ආර්යචක්‍රවර්ති
   - II. පරරාජසේකරම්
   - III. ලොරෙන්සෝ ද අල්මේදා
   - IV. පේරෝ ලෝපේස් ද සූසා

7. ලන්දේසීන් හා උඩරට පාලකයින් අතර එලදායී සම්බන්ධතා ආරම්භ වූයේ කුමන රාජ්‍ය කාලයේ ද?
   - I. ධර්මපාල රජු සමයේ
   - II. බුවනෙකබාහු රජ සමයේ
   - III. මායාදුන්නේ රජු සමයේ
   - IV. දෙවන රාජසිංහ රජ සමයේ

8. පෙරදිග ඕලන්ද වෙළඳ සමාගමේ මූලික අරමුණ වන්නේ,
   - I. ආර්ථික වශයෙන් ලාබ ඉපයීම.
   - II. දේශ ගවේෂණයට යාම.
   - III. පෘතුගීසීන් පන්නා හැරීම.
   - IV. ලන්දේසි ආගම පැතිරවීම.

9. විජයබා කොල්ලය ඇති වූ වර්ෂය වන්නේ,

I. 1521
II. 1512
III. 1564
IV. 1523

10. තමා ශ්‍රී සිංහල ආදි ස්වර යනුවෙන් හඳුන්වා දුන් රජු කවුද?

I. දෙවන රාජසිංහ රජු
II. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
III. පළමුවන විමලධර්මසූරිය රජු
IV. දෙවන රාජසිංහ රජු

## II කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

11. ක්‍රිස්තු වර්ෂ 1498 වර්ෂයේ ඉන්දියාවේ කැලිකට් වලට පැමිණි නායකයා කවුරුන්ද ?

12. පෘතුගීසීන් විසින් මුල් කාලයේ දී ශ්‍රී ලංකාව හඳුන්වනු ලැබූ නම කුමක්ද ?

13. ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ ප්‍රධාන මාර්ග තුන නම් කරන්න.

14. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කි ජාතිකයන් යටත් කරගනු ලැබුවේ කුමන වර්ෂයේද?

15. යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු දෙකක් ලියන්න.

16. ශ්‍රී ලංකාවට මුලින්ම පැමිණි පෘතුගීසි නායක ජාතිකයා හා ඔහු පැමිණි වර්ෂය සඳහන් කරන්න.

17. මන්නාරම ප්‍රදේශයේ කතෝලික ආගම පැතිරවීමේ කටයුතු වලට බාධා කළ යාපන පාලකයා ලෙසින් හැඳින්වෙන්නේ කවුද?

18. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට යාපනයේ රාජ්‍ය පාලනය කළ ආර්ය චක්‍රවර්ති පෙළපතට අයත් රජු කවුද ?

19. වර්ෂ 1521 දී ඇති වූ විශේෂ සිදුවීම කුමක්ද?

20. විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍ය බෙදී ගිය කොටස් තුන මොනවාද?

21. හත්වන බුවනෙකබාහු රජුගේ දියණිය ගේ නම කුමක්ද?

22. එම දියණියට සිටි පුතුන් දෙදෙනා නම් කරන්න.

23. එම කුමාරවරුන් දෙදෙනාගෙන් කෝට්ටේ රාජ්‍යයට උරුමකම් තිබුණේ කාට ද?

24. බලන සටනට නායකත්වය සැපයූ පෘතුගීසි සෙන්පතියා කවුද?

25. කපිතාන් ජෙනරාල්වරයෙකු වශයෙන් කටයුතු කළ කොන්ස්තන්තීනු ද සා ඌව ප්‍රදේශය හරහා උඩරට ආක්‍රමණය කිරීම සඳහා දියත් කළ සටන හඳුන්වන නම කුමක්ද?

26. ලන්දේසීන්ගේ ආසියා මූලස්ථානය පිහිටුවා ගත් ස්ථානය හඳුන්වන නම කුමක්ද ?

27. විමලධර්මසූරිය රජතුමාට පසු උඩරට රාජධානියට නව වැදගත්කමක් එකතු කරන ලද රජතුමා වන්නේ කවුරුන්ද?

28. නැගෙනහිර පළාතේ ලන්දේසි බලකොටුවක් ඉදි කළ ස්ථාන දෙකක් වන්නේ,

29. යාපනය රාජධානිය පෘතුගීසීන් විසින් යටත් කර ගැනීමට හේතු වූ කරුණු තුනක් ලියන්න.

30. සීතාවක රාජධානියේ පාලකයා බවට පත් වූයේ කුමන රජුද ?

31. සීතාවක රාජධානිය පිරිහීමට බලපෑ හේතු මොනවාද ?

32. යාපනයේ රාජධානියේ පාලන කටයුතු මෙහෙයවූ රජ පෙළපත නම් කරන්න.

33. පෘතුගීසීන් හා සංකිලි රජු අතර ගැටුමක් ඇති වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

34. යාපනය රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු මොනවාද?

35. පෘතුගීසීන් හා උඩරට පාලකයන් අතර ඇතිවූ සටන් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වර්ෂය | උඩරට පාලකයා | පෘතුගීසි සෙන්පතියා | සටන |
|---|---|---|---|
| | | | |

36. වර්ෂ 1638 දී උඩරට ලන්දේසීන්ගේ ගිවිසුමේ සඳහන් කරුණු මොනවාද ?

37. දෙවන රාජසිංහ රජු ලන්දේසීන් මෙරටට ගෙන්වා ගත්තේ කුමන අරමුණක් ඉටුකර ගැනීම සඳහා ද?

38. උපරිම ආර්ථික වාසි ලබා ගැනීමට ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්ති මොනවාද ?

39. වර්ෂ 1766 දී ඇති වූ ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද ?

40. එම නිසා උඩරට රාජධානියට සිදු වූ පාඩුව කුමක්ද ?

41. වර්ෂ 1764 දී ලන්දේසීන් උඩරට ආක්‍රමණය කළේ කුමන ලන්දේසි ආණ්ඩුකාරවරයා යටතේ ද ?

****

# ඒකකය - ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

එච්.පී.හර්ෂණ ඉන්ද්‍රජිත් මයා (0718247522) - ශ්‍රී ලං.ගු.සේ. - අම්/හිමිදුරාව විද්‍යාලය

## කාර්ය පත්‍රිකා අංක 12

❖ ප්‍රශ්න අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෙර අපරදිග වෙළඳාමේ දී යුරෝපා මහද්වීපය තුළ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්ව තිබූ ඉතා දියුණු වෙළඳ නගරය වූයේ,

I. වැනීසිය
III. කොන්ස්තන්තිනෝපලය
II. නේපල්ස්
IV. ජිනෝවා

02. කොන්ස්තන්තිනෝපල් නගරයඉස්ලාම් භක්තික තුර්කි ජාතිකයන්ට යටත් වූ වර්ෂය,

I. ක්‍රි.ව. 1658
III. ක්‍රි.ව. 1632
II. ක්‍රි.ව. 1453
IV. ක්‍රි.ව. 1418

03. පෘතුගාලය පිහිටි නිරිත දිග යුරෝපයට අයත් අර්ධද්වීපය වූයේ,

I. අයිබීරියන්
III. ග්‍රීක
II. ඉතාලි
IV. කොරියා

04.ක්‍රි.ව. 1498 දී ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණ "ක්‍රිස්තියානීන් සහ කුළු බඩු සොයා අපි මෙහි පැමිණියෙමු" යැයි ප්‍රකාශ කරන ලද්දේ,

I. පර්ඩිනන්ඩ් මැගලන්
III. බර්තෝලමියුඩයස්
II. ක්‍රිස්ටෝපර් කොලොම්බස්
IV. වස්කෝද ගාමා

05. පෘතුගීසීන් විසින් ශ්‍රී ලංකාව හඳුන්වන ලද්දේ,

I. සරන්ඩිබ් නමිනි.
III. සිලෝන් නමිනි.
II. සෙයිලන් නමිනි.
IV. රතු කැට දිවයින නමිනි.

06. ක්‍රි.ව. 1505 දී ලංකාවට අහම්බෙන් පැමිණි පෘතුගීසි ජාතිකයා වන්නේ,

I. ලොරෙන්සෝද අල්මේදා
III. කැබෙසහෝදරයෝ
II. වස්කෝද ගාමා
IV. ෆ්‍රැන්සිස්කූද අල්මේදා

07. බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසුව පෘතුගීසීන්ගේ ආරක්ෂාව මධ්‍යයේ කෝට්ටේ රාජධානියෙහි පාලකයා බවට පත් වූයේ,

I. මායාදුන්නේ
III. රයිගම්බංඩාර
II. ටිකිරි කුමරු
IV. ධර්මපාල කුමරු

08. ක්‍රි.ව. 1521 විජයබා කොල්ලයෙන් පසු මායාදුන්නේ රජු රාජ්‍යත්වයට පත් වන්නේ,

I. කෝට්ටේ
III. රයිගම
II. සීතාවක
IV. ගම්පොළ

09. ආසියාතික රටකදී පෘතුගීසීන් දරුණුතම පරාජයක් ලැබූ සටන වන්නේ,

I. සීතාවක සටන
III. මුල්ලේරියා සටන
II. බලන සටන
IV. දන්තුරේ සටන

10. ක්‍රි.ව.1602 දී පළමුවන විමලධර්ම සූරිය රජු හමු වූ ලන්දේසි දූතයා,

I. සිබල්ද වර්ට්
III. ජොරිස් වැන් ස්පිල්බර්ජන්
II. හියු බොයිඩ්
IV. ජෝන් පයිබස්

## II කොටස

11.

I. පෘතුගීසීන් කන්ද උඩරට රාජධානියට එරෙහිව සිදු කළ ආක්‍රමණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| වර්ෂය | සටන | සටනට නායකත්වය දුන් පෘතුගීසි සෙන්පතියා | එවකට සිටි උඩරට රජතුමා |
|---|---|---|---|
| i. 1594 | ................................ | පෙරෝලොපෙස්ද සූසා | ................................ |
| ii. ................ | බලන | ........................................ | පළමුවන විමලධර්ම සූරිය |
| ii. 1630 | ................................ | ........................................ | සෙනරත් රජතුමා |
| v. ................ | ගන්නෝරුව | ........................................ | ................................ |

II. ක්‍රි.ව. 1505දී පෘතුගීසීන් ලංකාවට පැමිණි අවධියේ ලංකාව තුළ ක්‍රියාත්මක වූ රාජධානි තුන සඳහන් කරන්න.

III. 1521 විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය බෙදී ගිය කොටස් තුන මොනවාද?

IV. පහත සඳහන් රාජධානිවල ආරම්භක පාලකයන් සඳහන් කරන්න.

a) කෝට්ටේ
b) සීතාවක
c) රයිගම
d) යාපනය

12. පහත සඳහන් සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයන් සඳහන් කරන්න.

I. හත්වන බුවනෙකබාහු රජුගේ දියණිය -
II. ධර්මපාල කුමරුගේ පියා -
III. VI වන විජයබාහු රජු මරණයට පත් කරන ලද්දේ -
IV. හත්වන බුවනෙකබාහු රජුගේ මරණය පිළිබඳ සඳහන් කළ පෘතුගීසි ලේඛකයා -
V. සීතාවක රාජධානියෙහි ආරම්භක පාලකයා -
VI. ක්‍රි.ව. 1505 දී පෙරදිග පෘතුගීසී ප්‍රතිරාජයා ලෙසින් පත් වූයේ -
VII. ටිකිරි කුමරු ලෙසින් හැඳින්වූයේ -
VIII. ක්‍රි.ව.1638 දී පෘතුගීසීන් සතු වූ මඩකලපුව බලකොටුවට පහර දුන් ලන්දේසි අණදෙන නිලධාරියා -
IX. ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් සමඟ ගිවිසුමකට එළැඹි උඩරට රජතුමා -
X. පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට යාපනය රාජ්‍යයෙහි පාලකයා වූයේ -

13. පහත සඳහන් සිද්ධීන්ට අදාළ වර්ෂයන් සඳහන් කරන්න.

I. ලන්දේසි වෙළඳ සමාගම (VOC සමාගම) ආරම්භ වීම -
II. සෙනරත් රජු පෘතුගීසීන් හා ගිවිසුමකට එළඹීම -
III. කීර්ති ශ්‍රී රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ගිවිසුම
IV. ලන්දේසීන් විසින් ලංකාවේ වෙරළබඩ කලාපයෙහි බලය පිහිටුවීම -
V. සංකිලි කුමාරයා යාපනයෙහි බලය අල්ලා ගැනීම -

14. විස්තර කරන්න.

I. යුරෝපීයයන් ආසියාවට පැමිණීම කෙරෙහි බලපෑ කරුණු තුනක් සඳහන් කරන්න.
II. හයවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයෙන් පසුව කෝට්ටේ රාජධානියෙහි පරිහානිය කෙරෙහි බලපෑ කරුණු දෙකක් විස්තර කරන්න.
III. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ දී මෙරට පැවති දේශපාලන තත්වය කෙබඳු වී දැයි කරුණු දෙකකින් පැහැදිලි කරන්න.
IV. කෝට්ටේ රාජධානියෙහි පරිහානිය කෙරෙහි ධර්මපාල රජුගේ ක්‍රියාකලාපය බලපෑ ආකාරය කරුණු දෙකකින් විස්තර කරන්න.